සියලු ම හිමිකම් ඇවිරිණි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## අදියර III විභාගය - 2023 ජනවාරි

## (301) මූල්‍ය වාර්තාකරණය

(Financial Reporting)

2023-02-25
පෙරවරු
[08.45 – 12.00]

පිටු ගණන : 10
ප්‍රශ්න ගණන : 10

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):

(1) ***දී ඇති කාලය :*** *කියවීම සඳහා - විනාඩි 15 යි.*
*උත්තර ලිවීම සඳහා - පැය 03 යි.*

(2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***

(3) *ඉල්ලුම් කරන ලද **මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,** ඔබ වෙත සපයන ලද **පොත්වල උත්තර** ලියන්න.*

(4) *ගණනය කිරීම් සහ පෙරවැඩ අමුණන්න. උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*

(5) *වැඩසටහන් ගතකිරීම කළ නොහැකි ගණක යන්ත්‍ර **පමණක්** භාවිත කිරීමට ඉඩ දෙනු ලැබේ.*

(6) *අර්ථකථන සහිත **කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව** අමුණා ඇත. සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*

(7) *ලකුණු 100.*

---

## A කොටස

(මුළු ලකුණු 20)

### 01 වන ප්‍රශ්නය

මූල්‍ය වාර්තාකරණය සඳහා වූ සංකල්පනාත්මක ආකෘතිමය රාමුවට අනුව, පොදු අරමුණු සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අරමුණ වන්නේ අස්තිත්වයට සම්පත් සැපයීම සම්බන්ධයෙන් තීරණ ගැනීමේදී පරිශීලකයින්ට ප්‍රයෝජනවත් මූල්‍ය තොරතුරු සැපයීමයි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) (i) අස්තිත්වයක මූල්‍ය තොරතුරු භාවිත කරන එකිනෙකට වෙනස් වූ පරිශීලකයින් දෙදෙනෙකු(02) **හඳුනා දක්වන්න**. (ලකුණු 01)

(ii) අස්තිත්වයක පරිශීලකයින් විසින් ගනු ලබන ආර්ථික තීරණ සඳහා උදාහරණ දෙකක්(02) **සඳහන් කරන්න**. (ලකුණු 02)

(b) මූල්‍ය වාර්තාකරණය සඳහා වූ සංකල්පනාත්මක ආකෘතිමය රාමුවට (Conceptual Framework) අනුව වාර්තාකරණ අස්තිත්වය (reporting entity) යනුවෙන් අදහස් කරන්නේ කුමක්දැයි **පැහැදිලි කරන්න**. (ලකුණු 02)

(මුළු ලකුණු 05)

### 02 වන ප්‍රශ්නය

තිරසාර වාර්තාකරණය (sustainability reporting), ත්‍රිත්වමය වාර්තාකරණය (triple bottom line reporting) ලෙසද හඳුන්වනු ලබන අතර, එය සමායතන සමාජීය වගකීම් [Corporate Social Responsibility (CSR)] වාර්තා කිරීම සඳහා භාවිත කරනු ලබයි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) තිරසර වාර්තාකරණයේ අරමුණු දෙකක්(02) **හඳුනා දක්වන්න**. (ලකුණු 02)

(b) "තිරසර වාර්තාවක්" යනු කුමක්දැයි **පැහැදිලි කරන්න**. (ලකුණු 03)

(මුළු ලකුණු 05)

## **03** වන ප්‍රශ්නය

2021 අප්‍රේල් 01 දින **සීමාසහිත මානෙල් පොදු සමාගම** විසින් **සීමාසහිත ඕලු පොදු සමාගමේ** සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනයෙන් 60% ක් රු. මිලියන 90 ක් ගෙවා අත්පත් කරගන්නා ලදි. එදිනට **සීමාසහිත ඕලු පොදු සමාගමේ** හඳුනාගත හැකි ශුද්ධ වත්කම්වල සාධාරණ අගය (fair value) රු. මිලියන 105 ක් වූ අතර, පාලනය නොවන හිමිකමේ සාධාරණ අගය රු. මිලියන 30 ක් විය.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) **සීමාසහිත ඕලු පොදු සමාගම** අත්පත් කරගැනීම මත ඇතිවූ කීර්තිනාමය (goodwill) **ගණනය කරන්න**. (ලකුණු 03)

(b) "පරිපාලිත සමාගම" යන පදය **පැහැදිලි කරන්න.** (ලකුණු 02)

(මුළු ලකුණු 05)

## **04** වන ප්‍රශ්නය

2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ සංස්ථාපනය කර ඇති අස්තිත්ත්ව විසින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර අදාල නියාමන ආයතන වෙත ඉදිරිපත් කළ යුතුය.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2007 අංක 07 දරණ සමාගම් පනතට අනුව, සමාගමක් විසින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අදාලවන නියාමන අවශ්‍යතාවයන් (regulatory requirements) තුනක්(03) **පැහැදිලි කරන්න**. (ලකුණු 05)

*A කොටසෙහි අවසානය*

# B කොටස

(මුළු ලකුණු 30)

## **05** වන ප්‍රශ්නය

(A) 2022 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා **සීමාසහිත සිග්මා එක්ස්පෝට් සමාගමේ** ගිණුම් පොත්වලින් පහත සඳහන් තොරතුරු උපුටාගෙන ඇත:

(1) 2022 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා බදු අයකළ හැකි ලාභය රු.800,000/- ක් විය.

(2) 2021 අප්‍රේල් 01 දිනට විලම්බිත බදු වත්කම් රු.150,000/- ක් විය.

(3) ජංගම නොවන වත්කම්වල ධාරණ අගය සහ බදු පදනම පහත සඳහන් පරිදි වේ:

| වත්කම් | 2022 මාර්තු 31 දිනට ධාරණ අගය (ගිණුම්කරණ ලියාහල අගය) (රු.) | බදු පදනම (රු.) |
|---|---|---|
| යන්ත්‍ර | 10,000,000 | 9,000,000 |
| මෝටර් වාහන | 6,000,000 | 5,500,000 |

(4) 2022 මාර්තු 31 දිනට පාරිතෝෂික වෙන්කිරීම රු.500,000/- කි.

(5) සමාගමට අදාල බදු අනුපාතය 14% කි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

පහත සඳහන් දෑ **ගණනය කරන්න**:

(a) 2022 මාර්තු 31 දිනට විලම්බිත බදු වත්කම / වගකීම. (ලකුණු 03)

(b) 2022 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා බදු වියදම. (ලකුණු 02)

(B) **සීමාසහිත ABC (පෞද්ගලික) සමාගම,** පරිගණක උපාංග විකිණීමේ ව්‍යාපාරයේ යෙදී සිටින ආයතනයකි. පහත සඳහන් ගනුදෙනු / සිදුවීම් වාර්තාකරණ කාල සීමාවෙන් පසුව සිදුවූ නමුත් 2022 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන අනුමත කිරීමට පෙර සිදුවිය.

(1) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2022 අප්‍රේල් 24 දින සාමාන්‍ය කොටස්හිමියන්ට වර්ෂයේ ලාභය මත කොටසකට රු.6/- බැගින් වූ අවසාන ලාභාංශයක් අනුමත කළ අතර, නිකුත්කොට ඇති කොටස් ගණන 100,000 කි.

(2) මීට වසර දෙකකට පෙර, සමාගමේ සේවය කළ සේවකයින් තිදෙනෙකු (3) විසින් සමාගමට විරුද්ධව කම්කරු විනිශ්චය සභාවේ නඩුවක් පවරා ඇත. 2022 අප්‍රේල් 26 දින මෙහි තීරණය ප්‍රකාශයට පත්කළ අතර, එහිදී එක් සේවකයෙකුට රු. මිලියන 2.5 බැගින් වූ වන්දියක් ගෙවන ලෙස ප්‍රකාශයට පත්විය.

(3) නවීන මාදිලියේ ලැප්ටොප් පරිගණක පැමිණීම හේතුකොටගෙන දැනට ඇති ලැප්ටොප් පරිගණක 50% ක වට්ටමක් සහිතව එකක් රු.55,000/- බැගින් විකුණන ලදී. ලැප්ටොප් පරිගණකයක පිරිවැය රු.80,000/- ක් වූ අතර, 2022 මාර්තු 31 දිනට ලැප්ටොප් පරිගණක 100 ක් සමාගම සතුවිය. මෙම ලැප්ටොප් පරිගණක සියල්ලම 2022 අප්‍රේල් මස පළමු සතිය තුළ විකුණා අවසන් කරන ලදී.

(4) 2022 අප්‍රේල් 09 දින, විදුලි කාන්දුවක් හේතුවෙන් අවිස්සාවේල්ල ගබඩාවේ ගින්නක් ඇතිවිය. මෙම නිසා සිදුවූ තොග හානියේ වටිනාකම රු. මිලියන 2.8 ක් විය.

(5) වර්ෂයේ එකතු කරගත් මුදල්වලින් රු.75,000/- ක වංචාවක් පිළිබඳව 2022 අප්‍රේල් 05 දින අනාවරණය විය.

**ඔබ විසින් කළ යුතු දෑ:**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 10 (LKAS 10) - වාර්තාකරණ කාලපරිච්ඡේදයට පසු සිදුවීම් ප්‍රමිතය අනුව, ඉහත එක් එක් අවස්ථාව 2022 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන තුළ හඳුනාගන්නේ කෙසේදැයි **පැහැදිලි කරන්න.** (ලකුණු 05)

(මුළු ලකුණු 10)

## 06 වන ප්‍රශ්නය

(A) 2021 අප්‍රේල් 01 දින, **සීමාසහිත ABC ලීසිං සමාගම,** විසින් වසර 3 ක මූල්‍ය කල්බදු ගිවිසුමක් යටතේ යන්ත්‍රයක් **සීමාසහිත XYZ සමාගමට** විකුණන ලදී. යන්ත්‍රයේ සාධාරණ අගය රු.2,400,000/- ක් විය. වාර්ෂික කල්බදු වාරිකය රු.1,205,375/- ක් වන අතර, එය සෑම වර්ෂයකම මාර්තු 31 දින ගෙවිය යුතු විය. ව්‍යංග (implied) වාර්ෂික පොලී අනුපාතය 24% ක් විය. **සීමාසහිත XYZ සමාගම** විසින් එහි පළමු කල්බදු වාරිකය 2022 මාර්තු 31 දින ගෙවා ඇත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

**සීමාසහිත ABC ලීසිං සමාගමේ** (කල්බදු දීමනාකරු) 2022 මාර්තු 31 දිනට / දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත දැක්වෙන ලෙජර් ගිණුම් **පිළියෙල කරන්න.**

(a) ලැබිය යුතු කල්බදු ගිණුම. (ලකුණු 04)

(b) නොඉපයූ මූල්‍ය ආදායම් ගිණුම. (ලකුණු 02)

(B) 2022 මාර්තු 31 දිනට **සීමාසහිත සෑම් සමාගමේ** මෝටර් රථයක ධාරණ අගය රු.3,600,000/- ක් වූ අතර, එය 2019 අප්‍රේල් 01 දින රු.4,800,000/- කට මිලටගෙන තිබුණි. 2022 මාර්තු 31 දින සමාගම විසින් හානිකරණ පරීක්ෂාවක් (impairment test) සිදුකළ අතර, එහිදී මෝටර් රථයේ ඉවත්කිරීමේ පිරිවැය අඩුකිරීමෙන් පසු එහි සාධාරණ අගය රු. මිලියන 2.8 ක් බවට හඳුනාගන්නා ලද අතර, එහි භාවිතයට ගැනීමේ අගය (value in use) රු. මිලියන 3 ක් විය.

**ඔබ විසින් කළ යුතු දෑ:**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 36 (LKAS 36) අනුව මෝටර් රථයේ හානිකරණ අලාභය **ගණනය කරන්න.**

(ලකුණු 04)

(මුළු ලකුණු 10)

## 07 වන ප්‍රශ්නය

**සීමාසහිත වූලා ට්‍රේඩිං සමාගමේ** 2022 මාර්තු 31 දිනට සහ 2021 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශන පහතින් දී ඇත:

**සීමාසහිත වූලා ට්‍රේඩිං සමාගම**
**මූල්‍ය තත්ත්ව ප්‍රකාශන** *(රු.'000)*

| මාර්තු 31 දිනට | 2022 | 2021 |
|---|---|---|
| **ජංගම නොවන වත්කම්:** | | |
| දේපළ, පිරියත සහ උපකරණ | 7,500 | 6,500 |
| සමුච්චිත ක්ෂය | (1,200) | (1,000) |
| **ධාරණ අගය** | **6,300** | **5,500** |
| **ජංගම වත්කම්:** | | |
| තොග | 1,100 | 1,500 |
| වෙළෙඳ සහ වෙනත් ලැබිය යුතු මුදල් | 1,380 | 2,020 |
| මුදල් සහ මුදල්වලට සමාන දෑ | 1,110 | 700 |
| | **3,590** | **4,220** |
| **මුළු වත්කම්** | **9,890** | **9,720** |
| **ස්කන්ධය සහ වගකීම්:** | | |
| **ස්කන්ධය:** | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 6,500 | 6,500 |
| රඳවාගත් ඉපැයීම් | 750 | 600 |
| | **7,250** | **7,100** |
| **ජංගම නොවන වගකීම්:** | | |
| දිගුකාලීන ණය | 1,000 | 1,200 |
| සේවක ප්‍රතිලාභ (පාරිතෝෂික සඳහා වෙන්කිරීම) | 480 | 420 |
| | **1,480** | **1,620** |
| **ජංගම වගකීම්:** | | |
| වෙළෙඳ ගෙවිය යුතු මුදල් | 800 | 650 |
| කෙටිකාලීන ණය | 120 | 120 |
| ගෙවිය යුතු පොලී | 150 | 100 |
| ගෙවිය යුතු ආදායම් බදු | 90 | 130 |
| | **1,160** | **1,000** |
| **මුළු ස්කන්ධය සහ වගකීම්** | **9,890** | **9,720** |

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) 2022 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් බදු වියදම රු.110,000/- කි.

(2) පිරිවැය රු.1,600,000/- ක් වූ යන්ත්‍රයක් 2021 අප්‍රේල් 01 දින රු.1,500,000/- කට විකුණන ලදී. 2021 අප්‍රේල් 01 දිනට මෙම යන්ත්‍රයේ සමුච්චිත ක්ෂය රු.350,000/- ක් විය. මෙම ගනුදෙනුවට අමතරව දේපළ, පිරියත හා උපකරණවල පවතින වෙනස වන්නේ 2022 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය තුළදී මිලට ගත් ඉඩමයි.

(3) වර්ෂයට අදාල ණය මත, ණය පොලී වියදම රු.125,000/- කි.

(4) වර්ෂය තුළදී සමාගම විසින් එහි සාමාන්‍ය කොටස්කරුවන්ට රු.300,000/- ක අතුරු ලාභාංශයක් ගෙවන ලදී.

(5) වර්ෂයට අදාල පාරිතෝෂික වෙන්කිරීම රු.100,000/- ක් වේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2022 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා **සීමාසහිත වූලා ට්‍රේඩිං සමාගමේ** මුදල් ප්‍රවාහ ප්‍රකාශනය <u>වක්‍ර ක්‍රමය යටතේ</u> **පිළියෙල කරන්න.** (ලකුණු 10)

*B කොටසෙහි අවසානය*

## C කොටස

(මුළු ලකුණු 50)

## 08 වන ප්‍රශ්නය

**සීමාසහිත තිඩෝ ලංකා සමාගමේ** ගිණුම් පොත්වලින් 2022 මාර්තු 31 දිනට, පහත සඳහන් ශේෂ පිරික්සුම උපුටාගෙන ඇත:

**සීමාසහිත තිඩෝ ලංකා සමාගම**

**2022 මාර්තු 31 දිනට ශේෂ පිරික්සුම** *(රු.'000)*

| | හර | බැර |
|---|---|---|
| ප්‍රකාශිත ප්‍රාග්ධනය (සාමාන්‍ය කොටස් 12,000,000) | | 120,000 |
| ප්‍රත්‍යාගණන සංචිතය | | 5,000 |
| 2021 අප්‍රේල් 01 දිනට රඳවාගත් ඉපැයීම් | | 10,000 |
| **දේපළ, පිරියත සහ උපකරණ, පිරිවැයට / ප්‍රත්‍යාගණන අගයට:** | | |
| ඉඩම සහ ගොඩනැගිල්ල (ඉඩමේ ප්‍රත්‍යාගණන අගය - රු. මිලියන 50) | 80,000 | |
| යන්ත්‍ර | 20,000 | |
| මෝටර් වාහන | 10,000 | |
| **2021 අප්‍රේල් 01 දිනට සමුච්චිත ක්ෂය:** | | |
| ගොඩනැගිල්ල | | 12,000 |
| යන්ත්‍ර | | 8,000 |
| මෝටර් වාහන | | 4,000 |
| ප්‍රාග්ධන නොනිමි වැඩ | 14,000 | |
| 2022 මාර්තු 31 දිනට තොගය, පිරිවැයට | 35,000 | |
| වෙළෙඳ ලැබිය යුතු මුදල් / වෙළෙඳ ගෙවිය යුතු මුදල් | 30,000 | 34,000 |
| අතැති මුදල් සහ බැංකුවේ ඇති මුදල් | 26,000 | |
| 2021 අප්‍රේල් 01 දිනට වෙළෙඳ ලැබිය යුතු මුදල් සඳහා වූ ප්‍රතිපාදනය | | 1,500 |
| රක්ෂණ වියදම | 12,000 | |
| විකුණුම් පිරිවැය / විකුණුම් | 135,000 | 239,500 |
| වෙනත් ආදායම් | | 9,000 |
| ගෙවූ ආදායම් බදු | 10,500 | |
| 2021 අප්‍රේල් 01 දිනට ගෙවිය යුතු ආදායම් බදු | | 8,500 |
| වෙනත් පරිපාලන වියදම් | 32,000 | |
| බෙදාහැරීමේ වියදම් | 34,000 | |
| මූල්‍ය වියදම් | 23,000 | |
| දිගු කාලීන ණය | | 10,000 |
| | **461,500** | **461,500** |

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) දේපළ, පිරියත සහ උපකරණ, පිරිවැය මත, සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරනු ලබන අතර, එම වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය පහත සඳහන් පරිදි වේ:

| | | |
|---|---|---|
| ගොඩනැගිල්ල | : | වර්ෂ 50 |
| යන්ත්‍ර | : | වර්ෂ 10 (මූලික හඳුනාගැනීමේදී) |
| මෝටර් වාහන | : | වර්ෂ 05 |

(2) යන්ත්‍ර ගිණුමේ ඇතුළත් වන්නේ 2018 අප්‍රේල් 01 දින මිලට ගත් යන්ත්‍රයක් පමණක් වන අතර, එය අත්පත් කරගත් දිනට එහි ප්‍රයෝජනවත් ආයු කාලය වර්ෂ 10 ක් ලෙස ඇස්තමේන්තුගතකොට ඇත. කෙසේවුවද, 2021 අප්‍රේල් 01 දින සිදුකරනු ලැබූ වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය පිළිබඳ සමාලෝචනයේදී 2021 අප්‍රේල් 01 දිනට යන්ත්‍රයේ ඉතිරි ප්‍රයෝජනවත් ආයු කාලය වර්ෂ 4 ක් බව හෙළිදරව් විය.

(3) 2019 අප්‍රේල් 01 දින රු. මිලියන 6 කට මිලට ගත් මෝටර් රථයක් 2021 සැප්තැම්බර් 30 දින රු. මිලියන 5.4 කට විකුණා ඇති අතර, එය වර්ෂයේ විකුණුමක් ලෙස විකුණුම් ගිණුමට බැරකොට ඇත. කෙසේවෙතත්, මෝටර් වාහන විකිණීම සම්බන්ධයෙන් විකිණීමෙන් ලද මුදල් පමණක් ගිණුම් පොත්වල සටහන් කොට තිබුණි.

(4) 2021 අප්‍රේල් 01 දින, නව ප්‍රදර්ශනාගාරයක් ඉදිකිරීම සඳහා සමාගම විසින් 10% ක වාර්ෂික පොලී අනුපාතිකයක් යටතේ රු. මිලියන 10 ක බැංකු ණයක් ලබාගෙන ඇත. ගොඩනැගිල්ලේ ඉදිකිරීම් 2021 මැයි මස 01 දින ආරම්භ කරන ලද අතර, 2022 මාර්තු 31 දින වනවිටත් එය ඉදිකෙරෙමින් පැවතුණි. ඉදිකිරීම සඳහා දරණ ලද පිරිවැය ප්‍රාග්ධන නොනිම් ගිණුමේ සටහන් කොට ඇති අතර, වර්ෂයට අදාල ණය පොලිය මූල්‍ය වියදම් ගිණුමේ සටහන් කොට ඇත. ණය මුදලේ ප්‍රාග්ධනය ආපසු ගෙවීම සඳහා බැංකුව විසින් වර්ෂ දෙකක සහන කාලයක් ලබාදී ඇති අතර, සම්පූර්ණ ණය මුදල මාසික වාරික 36 කින් ගෙවා නිමකළ යුතුවේ.

(5) ව්‍යාපාරයට, රු.500,000/- ක මුදලක් ලැබිය යුතුව තිබූ ණයගැතියෙකු 2022 මැයි 20 දින බුන්වත්භාවයට පත්ව ඇති බැවින් සම්පූර්ණ ණය මුදලම අයකර ගැනීමට නොහැකි වී ඇත. 2021 මාර්තු 31 දින මේ සඳහා ප්‍රතිපාදනයක් සිදුකොට තිබුණි. තවද, 2022 මාර්තු 31 දිනට පවතින ඉතිරි වෙළෙඳ ලැබිය යුතු මුදල් සඳහා 10% ක ප්‍රතිපාදනයක් සිදුකිරීමට සමාගමේ කළමනාකරණය තීරණය කොට ඇත.

(6) 2020/21 වර්ෂය සඳහා සම්පූර්ණ ආදායම් බදු වගකීම වන රු.8,500,000/-, 2022 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය තුළදී ගෙවා ඇති අතර, එය ගෙවූ ආදායම් බදු ගිණුමට අයකර ඇත. 2021/22 තක්සේරු වර්ෂය සඳහා ඇස්තමේන්තුගත ආදායම් බදු වගකීම රු.9,750,000/- ක් වේ.

(7) 2022 මාර්තු මාසය සඳහා වන විදුලිය සහ ජල බිල්පත්වල වටිනාකම පිළිවෙලින් රු.75,000/- ක් සහ රු.35,000/- ක් වන අතර, එය 2022 මැයි මාසයේදී ගෙවන ලදී. මෙම බිල්පත් 2021/22 මූල්‍ය වර්ෂයේදී ගිණුම් පොත්වල වාර්තාකර නොතිබුණි.

(8) 2022 සම්පූර්ණ ලිත් වර්ෂය සඳහා ගෙවන ලද රක්පණ වාරිකය, රක්පණ වියදම් ගිණුමේ සටහන්කොට ඇත.

(9) සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා වන අනුමැතිය 2022 ජුනි 05 දින ලබාදෙන ලදී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

ප්‍රසිද්ධ කිරීමට සුදුසු ආකාරයෙන්, **සීමාසහිත තිඩෝ ලංකා සමාගමේ** පහත සඳහන් දෑ, **පිළියෙල කරන්න**:

(a) 2022 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ'ලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය (විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය). (ලකුණු 10)

(b) 2022 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය. (ලකුණු 09)

(c) 2022 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ස්කන්ධයේ වෙනස්වීම් දැක්වෙන ප්‍රකාශනය. (ලකුණු 02)

(d) 2022 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා දේපළ, පිරියත සහ උපකරණවල වෙනස්වීම් දැක්වෙන සටහන. (ලකුණු 04)

(මුළු ලකුණු 25)

## 09 වන ප්‍රශ්නය

(A) **සීමාසහිත ලංකා බයෝ පොදු සමාගමේ** 2022 මාර්තු 31 දිනෙන් සහ 2021 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂ සඳහා උපුටාගත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශන සහ 2022 මාර්තු 31 දිනට සහ 2021 මාර්තු 31 දිනට උපුටාගත් මූල්‍ය තත්ත්ව ප්‍රකාශන පහත සඳහන් පරිදි වේ:

**සීමාසහිත ලංකා බයෝ පොදු සමාගම**

**ආදායම් ප්‍රකාශන උද්ධෘතයන්** *(රු.'000)*

| මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | 2022 | 2021 |
|---|---|---|
| විකුණුම් | 568,900 | 402,850 |
| විකුණුම් පිරිවැය | (315,240) | (282,450) |
| දළ ලාභය | 253,660 | 120,400 |
| පොලී වියදම | (6,280) | (5,840) |
| ආදායම් බදු | (3,500) | (4,000) |
| බදු පසු ලාභය | 26,750 | 18,200 |

**මූල්‍ය තත්ත්ව ප්‍රකාශන උද්ධෘතයන්** *(රු.'000)*

| මාර්තු 31 දිනට | 2022 | 2021 |
|---|---|---|
| ජංගම වත්කම් | 182,400 | 139,500 |
| ජංගම වගකීම් | 17,250 | 14,500 |
| වෙළෙඳ ලැබිය යුතු මුදල් | 121,500 | 109,500 |
| තොගය | 90,000 | 84,500 |
| කොටස්කරුවන්ගේ ස්කන්ධය | 54,010 | 24,760 |
| | | |
| නිකුත්කොට ඇති කොටස් ගණන ('000) | 7,500 | 7,500 |

*මුළු විකුණුම්වලින් 75% ක් ණයට විකුණුම් වන අතර, විකුණුම් පිරිවැයෙන් 85% ක් මිලදී ගැනුම් ලෙස උපකල්පනය කරන්න.*

**ඔබ විසින් කළ යුතු දෑ:**

ඉහත සඳහන් තොරතුරු මත පදනම්ව, 2022 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා / අවසන් දිනට **සීමාසහිත ලංකා බයෝ පොදු සමාගමේ** පහත සඳහන් අනුපාත **ගණනය කරන්න**:

(a) දළ ලාභ අනුපාතය.

(b) ක්ෂණික වත්කම් අනුපාතය.

(c) තොග රඳවා ගැනීමේ කාලය.

(d) ණයගැති එකතුකිරීමේ කාලය.

(e) කොටසක ඉපැයුම. (ලකුණු 05)

(B) **සීමාසහිත ලංකා බයෝ පොදු සමාගම** නියුතුව සිටින කර්මාන්තයේ, කර්මාන්ත සාමාන්‍යයන් පහත සඳහන් පරිදි වේ:

| | |
|---|---|
| දළ ලාභ අනුපාතය | 44% |
| ක්ෂණික වත්කම් අනුපාතය | 1.1 : 1 |
| තොග නේවාසික කාලය | දින 60 |
| ණයගැති එකතුකිරීමේ කාලය | දින 45 |
| කොටසක ඉපැයුම | රු.4.50 |

**ඔබ විසින් කළ යුතු දෑ:**

**සීමාසහිත ලංකා බයෝ පොදු සමාගමේ** ඉහත ගණනය කරන ලද අනුපාතයන්, කර්මාන්ත සාමාන්‍යයන් සමඟ සසඳමින් විචලනයන්ට හේතුවිය හැකි කරුණු පැහැදිලි කරමින් සාරාංශගත වාර්තාවක් **පිළියෙල කරන්න**.

(ලකුණු 10)

(මුළු ලකුණු 15)

## 10 වන ප්‍රශ්නය

**සීමාසහිත ගංගා පොදු සමාගම,** 2021 අප්‍රේල් 01 දින **සීමාසහිත යමුනා පොදු සමාගමේ** සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනයෙන් 80% ක් රු.මිලියන 90 කට අත්පත් කරගෙන ඇත. අත්පත් කරගැනීමෙන් ඇතිවූ කීර්තිනාමය රු. මිලියන 5 ක් වේ.

**සීමාසහිත ගංගා පොදු සමාගමේ** සහ **සීමාසහිත යමුනා පොදු සමාගමේ** 2022 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශ පහත පරිදි වේ:

**2022 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

**විස්තීර්ණ ආදායම් ප්‍රකාශ** *(රු.'000)*

| | **සීමාසහිත ගංගා පොදු සමාගම** | **සීමාසහිත යමුනා පොදු සමාගම** |
|---|---|---|
| විකුණුම් | 435,000 | 245,000 |
| විකුණුම් පිරිවැය | (269,700) | (147,000) |
| **දළ ලාභය** | **165,300** | **98,000** |
| **වෙනත් ආදායම්:** | | |
| කුලී ආදායම | 1,200 | 6,000 |
| ලාභාංශ ආදායම | 600 | - |
| දේපළ, පිරියත සහ උපකරණ විකිණීමේ ලාභ | 2,400 | 1,320 |
| **වියදම්:** | | |
| බෙදාහැරීමේ වියදම් | (27,500) | (16,000) |
| පරිපාලන වියදම් | (56,000) | (36,500) |
| මූල්‍ය වියදම් | (11,500) | (16,500) |
| බදු පෙර ලාභය | 74,500 | 36,320 |
| ආදායම් බදු | (12,500) | (8,400) |
| වර්ෂය සඳහා ලාභය | 62,000 | 27,920 |
| වෙනත් විස්තීර්ණ ආදායම් | 1,200 | (1,300) |
| **මුළු විස්තීර්ණ ආදායම** | **63,200** | **26,620** |

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) වර්ෂය තුළදී, **සීමාසහිත යමුනා පොදු සමාගම** විසින් පිරිවැය රු. මිලියන 50 ක් වූ භාණ්ඩ තොගයක් පිරිවැය මත 20% ක ලාභාන්තිකයක් සහිතව **සීමාසහිත ගංගා පොදු සමාගමට** විකුණන ලදී. 2022 මාර්තු 31 දිනට **සීමාසහිත ගංගා පොදු සමාගමේ** ගබඩාවේ **සීමාසහිත යමුනා පොදු සමාගමෙන්** මිලට ගත් රු. මිලියන 30 ක් වටිනා තොගයක් ඉතිරිව තිබුණි.

(2) වර්ෂය තුළදී, **සීමාසහිත ගංගා පොදු සමාගම** විසින් **සීමාසහිත යමුනා පොදු සමාගමේ** ගබඩාව පරිහරණය කිරීමට අදාලව රු.1,000,000/- ක වාර්ෂික කුලියක් ගෙවා ඇති අතර, මෙය **සීමාසහිත යමුනා පොදු සමාගමේ** වෙනත් ආදායම් යටතේ වාර්තාකොට ඇත.

(3) **සීමාසහිත ගංගා පොදු සමාගමේ** ලාභාංශ ආදායම් තුළ **සීමාසහිත යමුනා පොදු සමාගමෙන්** ලද ලාභාංශ පමණක් ඇතුලත්ව ඇත.

(4) 2021 අප්‍රේල් 01 දින, **සීමාසහිත ගංගා පොදු සමාගම** විසින් **සීමාසහිත යමුනා පොදු සමාගම** වෙත යන්ත්‍රයක් රු.6,000,000/- කට විකුණා ඇති අතර, එදිනට **සීමාසහිත ගංගා පොදු සමාගමේ** පොත්වල එම යන්ත්‍රයේ ධාරණ අගය රු.5,000,000/- ක් ලෙස දක්වා තිබුණි. 2021 අප්‍රේල් 01 දිනට, එම යන්ත්‍රයේ ඉතිරි ප්‍රයෝජනවත් ආයු කාලය වර්ෂ 5 කි. යන්ත්‍රය විකිණීමෙන් ලැබූ ලාභය, **සීමාසහිත ගංගා පොදු සමාගමේ** වෙනත් ආදායම් යටතේ දක්වා තිබේ.

(5) 2022 මාර්තු 31 දින හානිකරණ පරීක්ෂාවක් සිදුකරනු ලැබූ අතර, අත්පත් කරගැනීමේදී ඇතිවූ කීර්තිනාමය රු.මිලියන 2 කින් හානිකරණය වී ඇති බව එමගින් අනාවරණය විය.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2022 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඒකාබද්ධ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය **පිළියෙල කරන්න**. (ලකුණු 10)

*C කොටසෙහි අවසානය*

# කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| දැනුම (1) | තොරතුරු සහ මූලික සංකල්ප ආවර්ජනය කිරීම | **අඳින්න** | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | | **සම්බන්ධ කරන්න** | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාව තහවුරු කිරීම. |
| | | **සඳහන් කරන්න** | ස්ථිර ලෙස හෝ පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | | **හඳුනා දක්වන්න** | සැලකිලිමත්වීමෙන් පසුව හඳුනා ගැනීම, තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | | **ලැයිස්තුගත කරන්න** | විස්තර කිරීමකින් තොරව සම්බන්ධිත අයිතම ලිවීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| අවබෝධය (2) | අදහස් හා තොරතුරු පැහැදිලි කිරීම. | **හඳුනාගන්න** | අත්දැකීම් හෝ දැනුම භාවිතයෙන් වලංගුබව හෝ වෙනත් ආකාරයෙන් පෙන්වීම. |
| | | **අර්ථකතනය කරන්න** | වටහාගත හැකි හෝ හුරුපුරුදු පදවලට පරිවර්තනය කරන්න. |
| | | **විස්තර කරන්න** | ප්‍රධාන ලක්ෂණ ලියා සන්නිවේදනය කරන්න. |
| | | **පැහැදිලි කරන්න** | අදාල කරුණු භාවිත කර පැහැදිලි විස්තරයක් කිරීම. |
| | | **නිර්වචනය කරන්න** | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| භාවිතය (3) | අළුත් තත්ත්වයන් තුළ දැනුම භාවිත කර ගැලපීම. | **සසඳන්න** | තවත් එකක් සමග අනුගත / අනුරූප කරන්න. |
| | | **ප්‍රස්තාර දක්වන්න** | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | | **තක්සේරු කරන්න** | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | | **විසඳන්න** | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |
| | | **පිළියෙල කරන්න** | විශේෂ අරමුණ සඳහා යමක් කිරීම හෝ සූදානම් වීම. |
| | | **ප්‍රදර්ශනය කරන්න** | උදාහරණ සමග ඔප්පු කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම. |
| | | **ගණනය කරන්න** | ගණිතමය ගණනය කිරීම මගින් සොයා දැනගැනීම හෝ ගණන් ගැනීම. |
| | | **භාවිත කරන්න** | ප්‍රයෝගිකව භාවිතයේ යෙදෙන්න. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| විශ්ලේෂණය (4) | අදහස් අතර සම්බන්ධතා ගොඩනගා ප්‍රශ්න විසඳීම. | **සන්නිවේදනය කරන්න** | තොරතුරු බෙදාහදා ගැනීම හෝ හුවමාරු  කර ගැනීම. |
| | | **සැකිල්ලක් සේ දක්වන්න** | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |
| | | **අසමානතා බලන්න** | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | **සමානකම් බලන්න** | සමානකම් සොයාගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | **විමසන්න** | තර්ක මගින් සවිස්තර ලෙස පරීක්ෂා කිරීම. |
| | | **වෙනස්කොට දක්වන්න** | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දැ හඳුනා ගැනීම. |
| | | **විශ්ලේෂණය කරන්න** | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |